දුරකථන / Telephone
P. L. C. } 08-233419

Office } 08-234421, 08-222033 Ext: 272, 08-222233 274, 08-234191 292

Your No:

සිපිසි/එල්සි/1/5/වකුලේඛ

# පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත

மாகாண காணி ஆணையாளர் திணைக்களம்
மத்திய மாகாணம்

PROVINCIAL LAND COMMISSIONER'S DEPARTMENT
CENTRAL PROVINCE

මහලේකම් කාර්යාලය,
තැ. පෙ. 129,
මහනුවර.

செயலகம்,
த. பெ. 129,
கண்டி.

SECRETARIAT,
P. O. Box 129,
Kandy.

Date 2003.08.20

7 MAR 2008

මධ්‍යම පළාතේ සියළුම
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

## 1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන ( විශේෂ විධි·විධාන) පනත - අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීම හා උරුම ලියාපදිංචි කිරීම.

ඉහත සඳහන් පනත යටතේ ප්‍රදානය කරන ලද නියාදන සාධන පත්‍රයක පසු උරුමය නම් කිරීම අවලංගු කිරීම හා උරුමය ලියාපදිංචි කිරීම සඳහා විධිමත් ආකෘති පත්‍ර නොමැති කම නිසා එම ඉල්ලීම් ඉටු කිරීමට ඇති අපහසුතාව පිළිබඳව 2003.03.20 දින හා 2003.06.26 දින රැස්වූ පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ රැස්වීමේදී සාකච්ජා විය. එහිදී ඉඩම් කොමසාරිස් හා ඉඩම් අමාත්‍යාංශයේ එකඟත්වය මත ආකෘතිපත්‍ර කිපයක් පිළියෙල කොට අනුමත කරනු ලැබ ඇත. අදාල ආකෘතිවල පිටපත් මේ සමඟ එවමි.

** නි.සා.අංක 01**

මෙම ආකෘතිය නියාදන සාධන ප්‍රදානලාභි විසින් අනුප්‍රාප්තිය සඳහා හිමිකම් ඇති අයෙකු නම් කිරීම සඳහා භාවිතයට ගත යුතුය. මෙය පිටපත් හතරකින් සම්පූර්ණ කර ප්‍රාදේශිය ලේකම් වෙත ගෙන්වාගෙන ආවරණ ලිපියක් සමඟ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත යවා ලියාපදිංචි කරවීමට කටයුතු යර ඉන් පිටපත් 03 ක් ආපසු ගෙන්වා ගෙන එක් පිටපතක් ප්‍රදාන ලාභියාටද, අනෙක් පිටපත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නියාදන සාධන පත්‍රයේ පිටපතට ඇමිණීමටද, ඉතිරි පිටපත මා වෙත එවීමට ද ක්‍රියා කළ යුතුය.

නි.සා.අංක 01 ආකෘතිය සහතික කිරීමේදී ඉ කො 155 ආකෘතිය සහතිකකිරීම සම්බන්ධව දී ඇති උපදෙස් එලෙසම අදාල වේ. එහෙත් පසු උරුමකරුවන් නම් කිරීම හා අවලංගු කිරීම ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනතේ 9 (1) හා (2) වගන්ති වල උපදෙස් අනුව විය යුතුය. සහතික කිරීම සඳහා බලය ලැබී ඇති යම් බලධරයකු විසින් මෙම නම් කිරීම හා සහතික කිරීම නිත්‍යානුකූලව සිදුකර ඇද්ද යන්න පරීක්ෂා කිරීම ප්‍රාදේශිය ලේකම් විසින් සිදුකර, නිවැරදි නම් ආවරණ ලිපියක් සමඟ ලියාපදිංචිය සඳහා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතුය. මෙම පනත යටතේ අනුප්‍රාප්තිකයන් නම් කිරීම ඉ.සං.ආ.පනතේ විධිවිධාන හා සමාන නොවන බැවින් ඒ පිළිබඳ උපදෙස් ප්‍රදාන ලාභින්ට ලබාදීම ප්‍රාදේශිය ලේකම්ගේ වගකීම වේ. මෙම ආකෘති පත්‍ර දැනට මුද්‍රණය කොට නොමැති බැවින් මේ සමඟ එවනු ලබන ආකෘතිය ජායා පිටපත් කර අවශ්‍ය පිටපත් සකස් කර ගන්නා ලෙස ද දන්වා සිටිමි.

නි.සා.අංක 02

මෙම ආකෘතිපත්‍රය හඳුන්වා දී ඇත්තේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ ප්‍රදානය කරන ලද. දීමනා පත්‍රයක ප්‍රදානලාභි පනතේ 9 (1) වන වගන්තිය යටතේ ඉඩම සඳහා උරුම කරුවෙකු පත් නොකර මිය ගොස් ඇති අවස්ථාවක හෝ පත්කරනු ලැබූ උරුමකරු මියගොස් ඇති අවස්ථාවක එම ඉඩමේ උරුමය සහතික කර දීමටය. මෙවැනි අවස්ථාවක උරුම සහතික කර දිම ප්‍රාදේශිය ලේකම් විසින් කල යුතුය. මේ සම්බන්ධව අදාල වන විධි විධානය වන්නේ පනතේ 10 වන වගන්තියයි. මෙහිදී ප්‍රාදේශිය ලේකම් විසින් පරීක්ෂණයක් පවත්වා පනතේ 10 වන වගන්තිය අනුව ප්‍රදාන ලාභියාගේ අයිතිවාසිකම් වලට උරුමවී ඇති තැනැත්තා තෝරාගෙන ඔහු හෝ ඇය නමින් නි.සා.අංක 02 ආකෘතිය පිටපත් 04 කින් පිළියෙල කර උරුමය ලියාපදිංචි කර දිමට ක්‍රියා කළ යුතුය. ලියාපදිංචි කිරීමෙන් පසු ආපසු ගෙන්වා ගනු ලබන පිටපත් තුනෙන් එක් පිටපතක් උරුමකරුට භාරදිමටත්, අනෙක් පිටපත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නියාදන සාදන පත්‍රයේ අමුණා තැබිමටත් ඉතිරි පිටපත මා වෙත එවීමටත් ක්‍රියා කළ යුතුය. ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන ) පනත යටතේ උරුමකරුවන් තෝරා ගැනිම ඉ.සං.ආ.පනතට වඩා වෙනස්කම් දැකිය හැකි බැවින් , ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමුවිම අවශ්‍ය බව සිහිපත් කරමි.

මෙම ආකෘතිපත්‍ර වල සඳහන් වාක්‍ය රටාවන් මොනම හේතුවක් නිසා වෙනස් නොකල යුතු අතර , ඉහත උපදෙස් දී නැති අවස්ථා සඳහා සංශෝධනය කරමින් මෙම ආකෘති භාවිතා නොකල යුතුය.

මේ සම්බන්ධව ගැටලුවක් ඇත්නම් කරුණාකර මා අමතන්න.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස
පළාත් ඉඩම් කොමසාරිස්
මධ්‍යම පළාත.

පිටපත් :-

01. ඉඩම් කොමසාරිස්,
 කොළඹ - 2003.06.26 දින පළාත් ඉඩම් කොමසාරිස් රැස්විමේදි ගනු ලැබූ තිරණ අනුව - දැ.ගැ.ස.
02. දිස්ත්‍රික් ලේකම්,
 මහනුවර/ මාතලේ/ නුවරඑළිය - දැ.ගැ.ස.
03. නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් - අදාල ආකෘති පත්‍ර වල පිටපත බැගින් මේ සමඟ එවමි.කරුණාකර අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් වෙත ලබා දෙන්නේ නම් මැනවි.
04. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
 මහනුවර/ මාතලේ/ නුවරඑළිය / ගම්පොළ - අදාල ආකෘති පත්‍රවල පිටපත බැගින් මේ සමඟ එවමි. ඉදිරියේදි ප්‍රාදේශිය ලේකම් වරුන් විසින් එවනු ලබන මෙම ලේඛණ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.
05. මධ්‍යම පළාතේ සියළුම ඉඩම් නිළධාරින්, - දැ.ගැ.පි.

(96)



ආදර්ශ ආකෘතිය.

මගේ අංකය සිපිසි/එල්සි/1/5/3/24/උනු/92
2003 ජූලි මස වෙනි දින,
මධ්‍යම පළාතේ,
පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේදි ය.

ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
මහනුවර

**1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද නියාදන සාධන පත්‍රයක අයිතිය බැහැර කිරිම ලියාපදිංචි කිරිම.**

මෙම නියාදන සාධන පත්‍රයේ පෙර ලියා පදිංචිය පිළිබඳ විස්තරය පහත පරිදිය.

| නියාදන සාධන පත්‍රයේ අංකය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කල දිනය |
|---|---|---|
| 92 | 303/13 | 1979.07.20 |

මධ්‍යම පළාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස්, සේනපාල දසනායක අලහකෝන් බන්දුල බොරලැස්ස වන මම, 1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනතේ විධිවිධාන වලට අනුකූලව 1992 ක් වු නොවැම්බර් මස 16 වන දින ප්‍රදානය කරන ලද අංක 92 දරණ සාධන පත්‍රයේ ඉඩම් ලාභියා වන කඩුගන්නාව අඹගස්තැන්න අක්කර 18 අංක 193/4, හි පදිංචි හිනටිගල සංඝ ජේලි ආරියවංශගේ මාතුපාල මහතා විසින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම, දන්තුරේ කඳුරට සංවර්ධන බැංකුව වෙත නියාදන කිරිම ඉහත සඳහන් පනතේ 12 වන වගන්තිය යටතේ අනුමත කරමි. යථෝක්ත නියාදනය කිරිම ලියාපදිංචි කරන මෙන් ඉල්ලමි.

උප ලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට කඳුපළාතේ කෝරළේ ලගමුව නැමති ගමෙහි පිහිටි අංක 3491 දරණ මුලික පිඹුරේ බිම් කට්ටි අංක 31 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක් 0.121 ක් විශාල යැයි ගනන් බලා ඇති

| | |
|---|---|
| උතුරට. | කට්ටි අංක 29 |
| නැගෙනහිරට. | කට්ටි අංක 29 |
| දකුණට. | කට්ටි අංක 29 හා 32 |
| සහ බස්නාහිරට | කට්ටි අංක 32 හා 29 |

ද, මායිම් වු ශාන්තහෙලෙනා ජනපදය

නැමති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ඉඩම (රේඛා චිත්‍ර සටහනේ අංකය . මු.පි. මහ 3491 හි අංක 31)
මෙම ලිපියේ පිටපත් 04 ක් මේ සමඟ එවමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස,
පළාත් ඉඩම් කොමසාරිස්,
මධ්‍යම පළාත.